# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2451/27 - 2025 අගෝස්තු මස 28 වැනි බ්‍රහස්පතින්දා - 2025.08.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**සංශෝධිත 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 31 වගන්තිය සමග කියවිය යුතු 41 වගන්තිය යටතේ තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග**

01. තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍ය සුනිල් කුමාර ගමගේ වන මම, සංශෝධිත 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 31 වගන්තිය සමග කියවිය යුතු 41 වගන්තිය යටතේ තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යවරයා ලෙස මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2025.05.21 දිනැතිව අංක 2437/24 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරමි.

02. 2025.05.21 දිනැතිව අංක 2437/24 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය යටතේ* පළ කරන ලද 2025 අංක 01 දරන ක්‍රීඩා සංගම් නියෝගයන්හි 4 වන නියෝගයෙහි (2) සහ (3) උපවගන්ති වෙනුවට පහත දැක්වෙන උපවගන්ති ඇතුළත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ -

(2) පහත සුදුසුකම් සපුරා ඇති අයෙකු පමණක් ඉහත (1) හි (i), (ii) සහ (iv) යන තනතුරු සඳහා තෝරා පත් කරගැනීමට සුදුස්සෙකු විය යුතු ය.

(i) ක්‍රීඩා අමාත්‍යාංශයේ අනුමැතිය සහිතව ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ජාත්‍යන්තර තරග සඳහා සහභාගී වී තිබීම සහ/ හෝ

(ii) අදාළ ජාතික සංගමය විසින් සංවිධානය කරන ලද ජාතික ජ්‍යෙෂ්ඨ සහ/හෝ කනිෂ්ඨ ශූරතාවලදී හෝ ජාතික මහා ක්‍රීඩා උළෙලකදී, තනි ඉසව් සඳහා 1 වන, 2 වන සහ 3 වන ස්ථාන ලබා තිබීම සහ හෝ කණ්ඩායම් තරග සඳහා ශූරතාවය සහ/ හෝ පළවන අනුශූරතාවය සහ/හෝ දෙවන අනුශූරතාවය දිනූ කණ්ඩායමේ සාමාජිකයෙකු වීම සහ/හෝ




*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(iii) අදාළ ක්‍රීඩාවේ ආරක්ෂක සේවා ක්‍රීඩා/ ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ක්‍රීඩා / ජාතික මහා ක්‍රීඩා උළෙලේ පළාත් සහ දිස්ත්‍රික් තරග/ ජාතික පාසල් හෝ සමස්ථ ලංකා පාසල් ක්‍රීඩා / ජාතික පාසල් හෝ සමස්ථ ලංකා පාසල් ක්‍රීඩාවල පළාත් සහ දිස්ත්‍රික් තරග / ප්‍රසිද්ධ පාසල් ක්‍රීඩා / ජාතික යොවුන් ක්‍රීඩා / මහවැලි ක්‍රීඩා හෝ මෙයට අමතරව යම් ජාතික ක්‍රීඩා සංගමයක් විසින් අනුමත කරන ලද වෙනත් ජාතික මට්ටමේ ක්‍රීඩා උළෙලක හෝ ශූරතාවලියක තනි ඉසව් සඳහා 1 වන, 2 වන සහ 3 වන ස්ථාන ලබා තිබීම සහ/ හෝ කණ්ඩායම් තරග සඳහා ශූරතාවය සහ/ හෝ පළවන අනුශූරතාවය සහ / හෝ දෙවන අනුශූරතාවය දිනූ කණ්ඩායමේ සාමාජිකයකු වීම සහ / හෝ

(iv) වසර 15 කට වැඩි වෘත්තීමය අත්දැකීම් සහිත වරලත් ගණකාධිකාරිවරයකු වීම සහ/ හෝ වසර 15කට වැඩි වෘත්තීයමය අත්දැකීම් සහිත නීතිඥවරයෙකු වීම සහ/ හෝ ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ පූර්ණ සාමාජිකත්වය සමගින් වසර 15කට වැඩි වෘත්තීමය අත්දැකීම් සහිත වරලත් ඉංජිනේරුවරයෙකු වීම සහ/හෝ මෙරට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් අනුමත කරන ලද ඕනෑම විශ්ව විද්‍යාලයකින් ක්‍රීඩාව/ක්‍රීඩා විද්‍යාව පිළිබඳ ප්‍රථම උපාධියක් හෝ පශ්චාත් උපාධියක් සහිත අයෙකු වීම.

(3) පහත සුදුසුකම් සපුරා ඇති අයෙකු පමණක් ඉහත (1) හි (iii) තනතුරු සඳහා තෝරා පත් කරගැනීමට සුදුස්සෙකු විය යුතු ය.

(i) වරලත් ගණකාධිකාරිවරයෙකු වීම සහ/ හෝ

(ii) කළමනාකරණ ගණකාධිකාරිවරුන්ගේ වරලත් ආයතනයේ සාමාජිකයෙකු වීම සහ/ හෝ

(iii) සහතිකලත් වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ සාමාජිකයෙකු වීම සහ/ හෝ

(iv) මෙරට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් අනුමත කරන ලද ඕනෑම විශ්වවිද්‍යාලයකින් කළමනාකරණය හෝ වාණිජවේදය පිළිබඳ ප්‍රථම උපාධියක් හෝ පශ්චාත් උපාධියක් සහිත අයෙකු වීම.

**සුනිල් කුමාර ගමගේ** (පා. ම.),
තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍ය.

2025 අගෝස්තු මස 28 වැනි දින,
කොළඹ දී ය.

EOG 08 - 0310

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.